# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

10 ශ්‍රේණිය | නර්තනය | 19 - කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු තුලනාත්මකව ඉදිරිපත් කරමු.

- **සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

01) .................................................. රජතුමාගේ දිවිදෝෂය දුරු කිරීමට .................................................. නමැති ශාන්ති කර්මය පැවැත්වීය.

02) හැටපස් මංගල්‍යය නමැති ශාන්තිකර්මය ප්‍රථම වරට .................................................. උයනේදී පවත්වන ලදී.

03) .................................................. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මයයි.

04) අක්යාල දෙවියන් වෙනුවෙන් පුදනු ලබන්නේ .................................................. අරමුණු කොටගෙන ය.

05) වැදි යකුන් සහ මෙලෙයි යකුන් පිදීම කරනු ලබන්නේ .................................................. ශාන්තිකර්මයේ ය.

06) රාහු අසුරේන්ද්‍රයා .................................................. වෙසක් මවාගෙන මලය රජුගේ .................................................. නම් උයන පාළු කරන ලදී.

07) කොහොඹා කංකාරියේ ප්‍රධාන වශයෙන් .................................................. දෙවියන් පුද ලබයි.

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

08) අනුපිළිවෙලින් කඩවර කංකාරිය, දහඅට සන්නිය සහ කිරි මඩුව කවර නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම ද?

1) සබරගමු, උඩරට, පහතරට
2) උඩරට, පහතරට, සබරගමු
3) පහතරට, සබරගමු, උඩරට
4) උඩරට, සබරගමු, පහතරට

09) උඩරට ප්‍රදේශවලටම විශේෂ වූ ශාන්තිකර්මය වශයෙන් සැලකෙන්නේ මොනවා ද?

1) කොහොඹා කංකාරිය, වලියක් මංගල්‍යය, ගම්මඩුව
2) කොහොඹා කංකාරිය, බලි යාගය, කඩවර කංකාරිය
3) කොහොඹා කංකාරිය, කඩවර කංකාරිය, වලියක් මංගල්‍යය
4) කොහොඹා කංකාරිය, කඩකවර කංකාරිය, දෙහි කැපීම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

10) උඩරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම ලෙස ප්‍රචලිතව ඇත්තේ මොනවා ද?

| | |
|---|---|
| 1) වලියක් මංගල්‍යය සහ ගී මඩුව | 2) කොහොඹා කංකාරිය සහ කිරි මඩුව |
| 3) වලියක් මංගල්‍ය සහ ගම්මඩුව | 4) වැදියක් මංගල්‍යය සහ කවි මඩුව |

11) දෙවියන් වෙනුවෙන් කරනු ලබන ශාන්ති කර්ම වන්නේ මොනවා ද?

1) කොහොඹා කංකාරිය, වලියකුම, සූනියම් යාගය
2) ගම්මඩුව, පහන් මඩුව, කොහොඹා කංකාරිය
3) ගරා මඩුව, හැල්ලුම් මඩුව, රිද්දි යාගය
4) සන්නි යකුම, පූනා මඩුව, කිරි මඩුව

12) පහතරට, උඩරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්හි ශාන්තිකර්ම ප්‍රචලිත ප්‍රදේශ පිළිවෙලින් දක්වෙන්නේ කුමන පිළිතුරේද?

1) කුරුණෑගල දිස්ත්‍රික්කය, කලුතර දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කය
2) කෑගල්ල දිස්ත්‍රික්කය, කුරුණෑගල දිස්ත්‍රික්කය, කලුතර දිස්ත්‍රික්කය
3) කුරුණෑගල දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කය, කලුතර දිස්ත්‍රික්කය
4) කලුතර දිස්ත්‍රික්කය, කුරුණෑගල දිස්ත්‍රික්කය, රත්නපුර දිස්ත්‍රික්කය

13) උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මය ලෙස සලකනු ලබන්නේ කුමක් ද?

| | |
|---|---|
| 1) බලි ශාන්තිකර්මය | 2) දෙවොල් මඩුව |
| 3) සන්නියකුම | 4) කොහොඹා යක් කංකාරිය |

14) සබරගමු සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මය කුමක්ද?

| | |
|---|---|
| 1) කිරි මඩුව | 2) හැල්ලුම් මඩුව |
| 3) මංගල මඩුව | 4) පහන් මඩුව |

15) ශාන්තිකර්මයක අන්තර්ගතය ගොඩනැගී ඇත්තේ,

1) නර්තන, ගායන, වාදනය, නාට්‍යමය අවස්ථා හා චරිත්‍ර මඟිනි
2) සැරසිලි, චාරිත්‍ර, කවි ගායනා, බෙර වාදන සහ අභිචාර මඟිනි
3) බෙර, නලු ඇඳුම්, සැරසිලි, යක් දෙස්සන් සහ චාරිත්‍ර මඟිනි
4) කවි ගායනා, සන්න, සැහැලි, නමස්කාර සහ ශ්ලෝක මඟිනි.

16) කොහොඹා කංකාරියේ පුරාවෘත්ත කතාවේ දක්වෙන පුද්ගල නාම වශයෙන් පහත සඳහන් නම් හැඳින්විය හැකිය.

| | |
|---|---|
| 1) මලය රජ, ඊශ්වර, ගිරිදේවි | 2) සඳලිඳු, පඬිරජ, කුවේණි |
| 3) කිත්සිරි, සඳලිඳු, කුවේණි | 4) විජය රජ, රාහු අසුරේන්ද්‍රයා, හංසවතී |

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

17) පහත් මඩු ශාන්තිකර්මයට අයත් පුරාවෘත්ත කතාවේ සඳහන් චරිත වන්නේ,

1) විජය රජු සහ පඬුවස්දෙව් රජු ය.
2) සේරමාන් රජු සහ විජය රජු ය.
3) සේරමාන් රජු සහ පත්තිනි දේවිය ය.
4) පත්තිනි දේවිය සහ කුවේණිය ය.

18) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ එන පුරාවෘත්ත කතාවේ සඳහන් මලය රජුන් තිදෙනා ලෙස නම් කෙරෙන්නේ කවුරුන් ද?

1) ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර, වීරමුණ්ඩ
2) කිත්සිරි, සඳලිඳු, මලනිඳු
3) විජය රජු, පඬුවස්දෙව් රජු, මලය නිරිඳු
4) පඬි රජු, රාහු අසුරේන්ද්‍රයා, මලය නිරිඳු

19) කොහොඹා කංකාරියේ දී පුද ලබන දෙවියෙකි,

1) ඉරුගල් බණ්ඩාර
2) සත්පත්තිනි
3) හිරුරැස් සාමි
4) සඳරැස් සාමි

20) සබරගමු නර්තනය ප්‍රචලිත ප්‍රදේශයකි,

1) සතර කෝරලය
2) සල්පිට කෝරලය
3) පස්දුන් කෝරලය
4) කුකුලු කෝරලය

21) ශාන්තිකර්මවල දී පුද පූජා ලබන්නේ,

1) දෙවියන්, යකුන්, ප්‍රේතයන් ය.
2) දෙවියන්, යකුන්, ග්‍රහයින් ය.
3) සුරයන්, අසුරයන්, ග්‍රහයින් ය.
4) සුරයන්, අසුරයන්, යකුන් ය.

22) ''මඩු ශාන්තිකර්ම'' ලෙස හඳුන්වනු ලබන්නේ,

1) ග්‍රහයින් වෙනුවෙන් පවත්වන ශාන්තිකර්මයි.
2) යකුන් වෙනුවෙන් පවත්වන ශාන්තිකර්මයි.
3) යකුන් හා ග්‍රහයන් වෙනුවෙන් පවත්වන ශාන්තිකර්මයි.
4) දෙවියන් වෙනුවෙන් පවත්වන ශාන්තිකර්මයි.

23) පහතරට නර්තන සම්ප්‍රදායේ පත්තිනි දේවිය මුල් කර ගෙන කරනු ලබන ප්‍රධාන ශාන්තිකර්මය කුමක් ද?

1) රටයකුම
2) දෙවොල් මඩුව
3) සූනියම
4) දහඅට සන්නිය

24) බණ්ඩාර දෙවිවරුන්ට පිදීම දක්නට ලැබෙන්නේ,

1) කොහොඹා කංකාරියේ ය.
2) දොවොල් මඩුවේ ය.
3) පහන් මඩුවේ ය.
4) කිරි මඩුවේ ය.

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

25) දෙවොල් මඩුවේ පුද ලබන දෙවි කෙනෙක් වන්නේ කවුද?

1) මංගර දෙවි 2) කොහොඹා දෙවි

3) ලක්ෂ්මි දෙවඟන 4) පත්තිනි දෙවඟන

26) හිරුරැස් සාමි, සඳරැස් සසාමි, මහාසාමි යනුවෙන් දැක්වෙන්නේ,

1) කඩවර යකුන් ය. 2) වලියකුන් තිදෙනාය.

3) මලය රජවරු තිදෙනා ය. 4) දෙවොල් දෙවිවරු ය.

27) කොහොඹා කංකාරි ශාන්තිකර්මය ප්‍රචලිත ප්‍රදේශක් වන්නේ,

1) සියනෑ කෝරලය 2) සත් කෝරලය

3) රයිගම් කෝරලය 4) පස්දුන් කෝරලය

28) සම්ප්‍රදායන් තුනටම අයත් දෙවියන් වෙනුවෙන් කරන ශාන්තිකර්මයන්ගේ ප්‍රධාන අරමුණු වන්නේ,

1) සශ්‍රිකත්වය සහ සෞභාග්‍යයි 2) අපල උපද්‍රව දුරු කර ගැනීමයි.

3) යක්ෂ භූත උවදුරු දුරු කර ගැනීමයි. 4) විනෝදාස්වාදය යි.

29) කොහොඹා කංකාරි ශාන්තිකර්මය පැවැත්වීම සඳහා ඉටු කෙරෙන මූලික චාරිත්‍රය වන්නේ,

1) මඩු පේ කිරීමයි. 2) කප් සිටුවීමයි.

3) මල පේ කිරීමයි. 4) අයිලෙ යැදීමයි.

30) දෙවොල් මඩු සහ පහන් මඩු ශාන්තිකර්ම පැවැත්වීමේදී ඉටු කෙරෙන මූලික චාරිත්‍රය වන්නේ,

1) මඩු පේ කිරීමයි. 2) කප් සිටුවීමයි.

3) මල පේ කිරීමයි. 4) අයිලෙ යැදීමයි.

31) කොහොඹා කංකාරියට ආවේණික චාරිත්‍ර විධියක් වන්නේ,

1) කප් සිටුවීම යි. 2) මල පේ කිරීමයි.

3) තොට පේ කිරීම යි. 4) නානුමුර මංගල්‍යය යි.

32) කොහොඹා කංකාරි මඩුවේ ප්‍රමාණය විය යුත්තේ,

1) දිගින් හතලිස් රියනක් සහ පළලින් විසි රියනකි.

2) දිගින් අනු රියනක් සහ පළලින් තිස් රියනකි.

3) දිගින් හැට රියනක් සහ පළලන් තිස් රියනකි.

4) සම්මතයක් නොපවතී.

Agaram.LK - Keep your dreams alive!

33) ශාන්තිකර්ම කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීමට දිය බස්නාවක් වෙන් කර ගැනීම හඳුන්වන්නේ කුමන නමින් ද?

1) දිය කඩ වෙන් කිරීම. 2) දිය පේ කිරීම
3) ළිඳක් වෙන් කිරීම 4) තොට පේ කිරීම

34) කප් සිටුවීම සඳහා යොදාගනු ලබන්නේ,

1) කිරි ගසක අත්තකි 2) කොහොඹ අත්තකි
3) සිටුවීමට පසු පැළවන ලීයකි 4) මිල්ල අත්තකි

35) "මුරුතැන්" ලෙස හඳුන්වන්නේ,

1) දෙවියන්ට වෙන්කළ වී හාල් ය. 2) දෙවියන් වෙනුවෙන් පිසූ ආහාරය
3) යකුනට දෙදන දොළ පිදේනි ය. 4) දෙවියන්ට අයත් විමානය.

36) කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්මවලට පොදු වූ චාරිත්‍රයකි,

1) බත බුලතේ යෑම 2) මිල්ල කැපීම
3) මඩු පේ කිරීම 4) ගිනි පෑගීම

37) "අක්යාල" නැතහොත් "අගහස් වෙන් කිරීම" යනු,

1) පරිභෝජනයට පෙර අස්වැන්නෙන් දෙවියන්ට වෙන් කර කොටසයි.
2) බැත හුළං කිරීමේදී බොල් වී වෙන් කිරීමයි.
3) ගොයම් පෑගීමට පෙර දෙවියන්ට බාර හාර වෙන් කිරීමයි.
4) අස්වැන්න සරු කර දෙන ඉල්ලා දෙවියන්ට පුද පූජාවෙන් කිරීමයි.

agaram.lk

38) කප් සිටුවීම හා රුක් පේ කිරීම,

1) ශාන්තිකර්මයට අදාළ පූර්ව චාරිත්‍රයකි. 2) ශාන්තිකර්ම දින චාරිත්‍රයකි.
3) ශාන්තිකර්මයට පෙර දින චාරිත්‍රයකි. 4) ශාන්තිකර්මයට පසු දින චාරිත්‍රයකි

39) මිල්ල කැපීම සිදු කරනු ලබන්නේ,

1) දෙවොල් මඩුවේ සහ පහන් මඩුවේ ය. 2) රිද්දි යාගයේ සහ රට යකුමේ ය.
3) කොහොඹා කංකාරියෝ සහ ගම්මඩුවේය. 4) කිරි මඩුවේ සහ වලියකුමේය.

40) කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව සහ පහන් මඩුව යන ශාන්තිකර්ම තුනෙහිම අන්තර්ගත චාරිත්‍ර වන්නේ,

1) කපු සිටුවීම, මඩු පේ කිරීම, මඟුල් බෙර වාදනය යි.
2) කප් සිටුවීම, කොට පේ කිරීම, මිල්ල කැපීමයි.
3) කප් සිටුවීම, අක්යාල වෙන් කිරීම, බත බුලතෙ යෑම යි.
4) කප් සිටුවීම, රුක් පේ කිරීම, තෙල් වැඩම කිරීමයි.

41) ''මඩු පේ කිරීම'' යනුවෙන් හඳුන්වන්නේ,

1) මඩු කුඩාරම් ඉදි කිරීමයි.
2) ඉදි කළ මඩුව වලු මල ආදියෙන් සැරසීමයි.
3) මඩුව දෙවියන් වෙනුවෙන් කැප කිරීමයි.
4) මඩුවෙහි අගහස් තැන්පත් කිරීමයි.

42) ''හගල'' යනු,

1) ශාන්තිකර්ම ශිල්පීන්ගේ ආභරණයකි.
2) ශාන්තිකර්ම ශිල්පීන් විසින් අඳිනු ලබන රෙද්දකි.
3) ශාන්තිකර්ම සැරසිල්ලකි.
4) ශාන්තිකර්මයට අදාළ පූජා භාණ්ඩයකි.

43) ශාන්තිකර්මයක දී කරනු ලබන නමස්කාර ගායනාවකින් බලාපොරොත්තු වන්නේ,

1) බුදුන් වහන්සේගේ ගුණ වර්ණනා කිරීමයි.
2) ත්‍රිවිධ රත්නයේ අවසර ලබා ගැනීමයි.
3) ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීමයි.
4) ආතුරයාට සෙත් පැතීමයි.

44) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ගායනය සහිත නර්තන අංග දෙකකි,

1) අස්නෙ, කොහොඹා හැල්ල
2) අස්නෙ, කෝල්පාඩුව
3) දුනුමාලප්පුව, කෝල්පාඩුව
4) දුනුමාලප්පුව, අස්නේ

45) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ අන්තර්ගත නර්තනාංගයක් නොවන්නේ,

1) හත්පද
2) වාහන නැටීම
3) දුනුමාලප්පුව
4) මාරා පද

46) සිරසපාද කවි ගායනාවන්ගෙන් ප්‍රධාන වශයෙන් බෙලාපොරොත්තු වන්නේ,

1) භව භෝග සම්පත් ආරක්ෂා කර ගැනීමයි.
2) අතුරු ආන්තරා මග හරවා ගැනිමයි.
3) සියලු රෝදුක් දුරු කරලීමයි.
4) විනෝදාස්වාදයයි.

47) පහතරට, උඩරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්හි ශාන්තිකර්ම සඳහා ආවේණික වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් ඇත්තේ කුමන පිළිතුරේද?

1) ගැටබෙරය, දවුල, යක්බෙරය
2) යක්බෙරය, දවුල, ගැටබෙරය
3) යක්බෙරය, ගැටබෙරය, දවුල
4) දවුල, ගැටබෙරය, යක්බෙරය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk


agaram.lk

48) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ගායනය සහිත නර්තනාංගය කුමක්ද?

1) යක්තුන් පදය
2) ආවැන්දුම
3) ගබඩා කොල්ලය
4) මඩුපුරය

49) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දී යොදා ගන්නා රංග භාණ්ඩයකි,

1) අත්මල
2) පන්දම
3) ඌරකුගේ අනුරුව
4) රඹකැන්

50) කොහොඹා කංකාරියෝ නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන අවස්ථා දෙකකි,

1) ගුරුගේ මාලාව, හත් පදය
2) යක්කම්, ගුරුගේ මාලාව
3) අස්නෙ, බුලත් පදය
4) කොතල පදය, සලු පදය

51) කොහොඹා කංකාරියේ නාට්‍යමය පෙළපාලි ලෙස සැලකෙන්නේ,

1) ඌරා යක්කම සහ අස්නෙ
2) දුනු මාලප්පුව සහ ආවැන්දුම
3) යක්කම් සහ ගබඩා කොල්ලය
4) ගුරුගේ මාලාව සහ හත් පදය

52) නාට්‍යමය පෙළපාලි බහුලව දක්නට ලැබෙන ශාන්තිකර්ම ඇත්තේ,

1) බදුලු ප්‍රදේශයේ පවත්නා සබරගමු නර්තනයේ ය.
2) පහතරට නර්තන සම්ප්‍රදාය පාදක කරගෙනය.
3) උඩරට කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ය.
4) මුහුදුබඩ ප්‍රදේශවල සහ කඳුකර ප්‍රදේශවලය.

53) ''ගුරුගේ මාලාව'' නමැති නාට්‍යමය පෙළපාලියට අයත් ශාන්තිකර්මය කුමක්ද?

1) දෙවොල් මඩුව
2) පහන් මඩුව
3) කොහොඹා කංකාරිය
4) හැල්ලුම් මඩුව

54) ශාන්තිකර්මයෙන් පරිබාහිරව ප්‍රභවය ලැබූ නර්තනාංග වන්නේ,

1) බුලත් පදය, කොතල පදය
2) රබන්, යක් ඇනුම
3) උඩැක්කි, පන්තේරු
4) වන්නම්, අස්නේ

55) අප ශාන්තිකර්ම සුරැකිය යුත්තේ,

1) විනෝදයට නැරඹිය හැකි නිසාය.
2) මනහර නර්තන තිබෙන නිසාය.
3) අපේ සාම්ප්‍රදායික සංස්කෘතික උරුමයන් නිසාය
4) ලෙඩ රෝග නිවාරණය කරන නිසාය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව පහන් මඩුව යන ශාන්තිකර්ම මුල් කරගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

56) ශාන්තිකර්ම යනු කුමක්දැයි හඳුන්වන්න.
57) සම්ප්‍රදායන් ත්‍රිත්වයේ ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු ලියන්න.
58) දේශීය ශාන්තිකර්ම තුනට අයත් පුරාවෘත්ත කතාව වෙන වෙනම ලියන්න.
59) ඉහත ශාන්තිකර්ම තුනෙහි පුද ලබන දෙවිවරු හා යකුන්, නර්තන අංග, චාරිත්‍ර විධි 03 බැගින් ලියන්න.
60) ශාන්තිකර්ම ත්‍රිත්වයටම පොදු චාරිත්‍ර 03 ක් නම් කරන්න.
61) ශාන්තිකර්ම තුනට අයත් ගායන, වාදන අංග හා සැරසිලි පිළිබඳ විස්තරයක් කරන්න.
62) දේශීය ශාන්තිකර්ම මඟින් සමාජයට ලබාදෙන යහපත් ආකල්ප විස්තර කරන්න.
63) කොහොඹා කංකාරියේ දක්නට ලැබෙන ගායනය සහිත නර්තන අංග දෙකක් සහ ගායනය රහිත නර්තන අංග දෙකක් නම් කරන්න.
64) දෙවොල් මඩුවේ දක්නට ලැබෙන ගායනය සහිත නර්තන අංගයක් සහ ගායනය රහිත නර්තන අංගයක් නම් කරන්න.
65) පහන් මඩුවේ දක්නට ලැබෙන ගායනය සහිත නර්තන අංග දෙකක් සහ ගායනය රහිත නර්තන අංග දෙකක් නම් කරන්න.
66) ශාන්තිකර්ම පැවැත්වීමේදී සාමූහිකව කරනු ලබන කාර්යයන් තුනක් ලියන්න.
67) ශාන්තිකර්ම ත්‍රිත්වයේම දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාළි තුන බැගින් නම් කරන්න.
68) ශාන්තිකර්ම ත්‍රිත්වයේම දක්නට ලැබෙන ආසාත්මක ගායනා අංග දෙක් සහ අනාසාත්මක ගායනා අංග දෙකක් නම් කරන්න.
69) ශාන්තිකර්ම ත්‍රිත්වයටම අයත් පොදු වාදන අංග දෙකක් නම් කරන්න.
70) දෙවොල් මඩුවේ සහ පහන් මඩුවේ දක්නට ලැබෙන රංග වස්ත්‍රාභරණ කට්ටල දෙක බගින් නම් කරන්න.
71) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දක්නට ලැබෙන ප්‍රධාන රංග වස්ත්‍රාභරණක කට්ටලය කුමක් ද?
72) ශාන්තිකර්ම ත්‍රිත්වයේම දක්නට ලැබෙන සැරසිලි අංග තුන බැගින් නම් කරන්න.
73) එම සැරසිලි අංග සඳහා පොදුවේ පරිසරයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍ය පහක් නම් කරන්න.
74) ශාන්තිකර්ම ත්‍රිත්වයේම දක්නට ලැබෙන රංග භාණ්ඩ තුන බැගින් නම් කරන්න.
75) ඌරා යක්කම සහ අඹ විදමන පිළිබඳව වාක්‍ය හතරක් ලියන්න.
76) කොහොඹා කංාරියේ දක්නට ලැබෙන ශාස්ත්‍රීය නර්තනාංග දෙකක් පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න.
77) තෙල්මෙ සහ දෙවොල් නර්තනාංග පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න.
78) පහන් මඩුවේ දක්නට ලැබෙන ශාස්ත්‍රීය නර්තන අංග දෙකක් පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සැකසුම:- නවමල් ජයවීර මයා